සැ. යු. - 2009.04.03 දින පළ වූ අංක 1,596 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,597 - 2009 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2009.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 473 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 472 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 475 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහජන බැංකුව - මිද්දෙනිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009.04.28 වැනි දින පෙ. ව. 11.00 ට මෙහි පහත විස්තර වන යන්ත්‍ර සූත්‍ර ආදිය අඟුණුකොළපැලැස්ස මහජන බැංකු පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තරය

| අනු අංකය | වර්ගය (MAKE) | මෝස්තරය MODEL | අනුක්‍රමික අංකය SERIAL NO. |
|---|---|---|---|
| | MACHINES - 25 | | |
| 01 | YAMATA | DL -55 | 20070413209 |
| | | | 20070413224 |
| | | | 20070413163 |
| | | | 20070413192 |
| | | | 20070311868 |
| | | | 20070413276 |
| | | | 20070311831 |
| | | | 20070413213 |
| | | | 20070413271 |
| | | | 20070413245 |
| | | | 20070311829 |
| | | | 20070413264 |
| | | | 20070413150 |
| | | | 20070413279 |
| | | | 20070413285 |
| | | | 20070311866 |
| | | | 20070413297 |
| | | | 20070413296 |
| | | | 20070413267 |
| | | | 20070413201 |
| | | | 20070413166 |
| | | | 20070413193 |
| | | | 20070413200 |
| | | | 20070413237 |
| | | | 20070413212 |
| 02 | OVER LOG MACHINES - 02 | | |
| | Juki | JR 2220-6 | 700412024 |
| | Juki | JR 2220 6 | 700412026 |
| | CUTTING MACHINES - 01 | | |
| 03 | CZD - 03 | | |
| 04 | NOS - 27 DCL - 12H | CLUTCH MOTOR | |
| 05 | NO - 01 SILVER STARIIRON | ES. 300 | 002396 |
| 06 | NO. 01 STJ 07 IRONING RABLE | | |
| 07 | NOS - 27 - MESHINES - STAND | | |

වැඩි විස්තර සඳහා 2008.12.05 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.01.20 දින දිනමිණ තිනකරන් හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු පහත සඳහන් පරිදි මුදලින් ගෙවිම් කළ යුතුය.

01. මිළදීගත් සම්පූර්ණ මුදල ද,
02. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2ක් ද,
03. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
04. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද වේ.

ඉහත දක්වා ඇති යන්ත්‍ර සූත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් මහජන බැංකුව විසින් භාරගනු නොලැබේ.

වැඩි විස්තර සඳහා හම්බන්තොට ටවර්හිල් මාවතේ අංක 7 A දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාගෙන් විමසන්න.

දුරකථන අංක 047- 2220900, 2220901 හා 2220903.
ෆැක්ස් අංකය : 047-2220900.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම.
දුරකථන අංක : 041-2228731,
071-4438516.

04-260

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දඹුල්ල, කුරුණෑගල පාර, අංක 465 දරන ස්ථානයේ පදිංචි කොන්ඩසිංහ පටබැඳි ගෙදර සීලවතී සහ දෙහිවල, ක්වයිරි පාර, අංක 72/ඒ දරන ස්ථානයේ පදිංචි කන්දසිංහ පටබැඳි ගෙදර අනුලාවතී ආරියසේන වන අප විසින් අයි. ජී. මුණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් වර්ෂ 2007ක් වූ අප්‍රේල් මස 23 වැනි දින ලියා සහතික කළ අංක 6668 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාතලේ, කවටයාමුණ කවුඩුපැලැල්ලේ පදිංචි දිසානායක මුදියන්සෙලාගේ අජිත් නන්දකුමාර දිසානායක වෙත දෙන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරනු ලබන බව ද, මින්පසු එම ඇටෝර්නි බලපත්‍රය කිසිදු බලපැවැත්මක් නොමැති බව ද, සියල්ලෝ ම මෙයින් දැනගනිත්වා.

1. කොන්ඩසිංහ පටබැඳි ගෙදර සීලවතී.
2. කන්දසිංහ පටබැඳි ගෙදර අනුලාවතී ආරියසේන.

04-302

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වයි. විජයපාලන් සොලිසිටර්තැන ඉදිරියේ ලියා අත්සන් කළ 1999 නොවැම්බර් 15 දින දරන ඇටර්නි බලපත්‍රය යටතේ කොළඹ 9, බේස්ලයින් පාරේ, අංක 142 හි පදිංචි පොන්නයියා බාස්කරසිංහම් මහතාට එම ලිපිනයේ ම පදිංචි ඥාන මහිල්දිනී බාස්කරසිංහම් යන අය විසින් දී තිබූ ඇටර්නි බලය අවලංගු කරන ලදී.

ඥාන මහිල්දිනී බාස්කරසිංහම්.

04-171

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දැනට එන්. ඩබ්. 1025 හි එච්. ලන්ඩන්, විල්ස්ඩන්, ගෝවන් රෝඩ් අංක 17 හි පදිංචි කහවත්තගේ නාලිකා නිලංගනී වන මම කඩවත, ඉහල බියන්විල, කොස්ලන්ද වත්ත, අංක 7/603 හි පදිංචි කහවත්තගේ මංජුල දිල්හාන් යන අයට මා විසින් දුන් ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 334 බාණ්ඩයේ 33 පත්ඉරුවේ 9476 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කරන ලද, 2006.06.01 දිනැති ප්‍රසිද්ධ නොතාරිස් චම්පිකා කාරියවසම් ඉදිරිපිට අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රය මා විසින් අවලංගු කර නිෂ්ප්‍රභා කරන බව සියළු දෙනාම දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද එකී ඇටෝර්නි බලකරය මත එම ඇටෝර්නි විසින් මින් ඉදිරියට අත්සන් කරනු ලබන කිසිදු ලියකියවිලි සඳහා ද ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහාද මා වගකීමක් බාරනොගන්නා බව ද දන්වා සිටිමි.

04-200

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට දන්වන වග නම්, කුරුණෑගල, මරල්වාව, අංක 129 හි පදිංචි මහන්තේ ආරච්චිලාගේ නිශාන්ත සේනක (ජා. හැ. 753140131v) වන මා කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. එච්. කිරින්ද මහතා විසින් සහතික කළ අංක 513 සහ 2008.06.23 දින දරන ඇටර්නි බලපත්‍ර මඟින් කුරුණෑගල විල්ගොඩවත්ත, අංක 144 හි පදිංචි වීරසිංහ දේවගේ ශ්‍රීනාත් දුමින්ද වීරසිංහ (ජා. හැ. 861250377v) යන අයට දෙන ලද ඇටර්නි බලය අවලංගු කළ බව මෙයින් දන්වමු. මා වෙනුවෙන් මොහු විසින් කරන ලද කිසිදු ක්‍රියාවකට වග නොකියන බව ද තවදුරටත් දැනුම් දෙමි.

04-196

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක : 155/1 බී, හයිලෙවල් පාර, පන්නිපිටිය හි පදිංචි වල්පොලගේ සුජිත් ප්‍රියලාල් වල්පොල වන මා විසින්, 2004.11.12 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් තිලිණා තාමරසී විතාරණ විසින් සහතික කළ අංක : 26 දරන ඇටෝර්නි බලපත්‍රය යටතේ ශානිකා කළුපහන හට දෙන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බවත්, 2009 ක් වූ මාර්තු මස 25 වැනි දින සිට ඇය වෙත පවරා තිබූ ඇටෝර්නි බලපත්‍රය යටතේ ඉහත කී අය විසින් කරනු ලබන සියළුම ගනුදෙනු වලංගු නොවන බවත්, වග නොකියන බවත්, නිශ්ප්‍රභ කරන බවත්, පිළිනොගන්නා බවත්, උතුම් වූ ලක් රජයටත් මහජනතාවටත් මින් දැනුම් දෙන්නෙමි.

04-212

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : උරුමය සෝෂල් එන්ටප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 67301, 2009.03.16
ලියාපදිංචි ලිපිනය : අංක 47, ග්‍රෙගරි පාර, කළුතර දකුණ.

අධ්‍යක්ෂ.

04-215

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ පහත සමාගම ලියාපදිංචි කරන ලද බව දැනුම් දීමයි.

සමාගමේ නම : වික්ටෝරියා ඊ. එම්. සී. (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 67259 09.03.2009 දින
ලියාපදිංචි ලිපිනය : අංක 225, නාවල - නාරාහේන්පිට පාර, කොළඹ 05.

අධ්‍යක්ෂක.

03-206

---

### ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

ගාල්ල, අංකොක්කාවල, වැලිකැටිය හි පදිංචි සෝමවතී විමලනාත වන මා විසින් වර්ෂ 2008.11.05 දින (ගාල්ල) ප්‍රසිද්ධ නොතාරිස් මානෙල් කේ. මුදලිගේ තැන ලවා ලියා සහතික කරන ලද අංක 1824 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් හියාරේ අමල්ගම පදිංචි නානායක්කාර බඳුන් ගොඩගේ නිමල්සිරි යන අයට දී ඇති බලතල මෙයින් අහෝසි කරන බව සියලු දෙනාගේම දැන ගැනීම පිණිස මෙයින් දන්වා සිටිමි.

සෝමවතී විමලනාත.

04-249

---

### වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ලියාපදිංචි අංක PQ 98 දරන ඒස් පව(ර්) ජෙනරේෂන් මාතර පීඑල්සී, සමාගම වර්ෂ 2009 මාර්තු මස 20 දින සිට කොටස් වෙළඳපොළ ලියාපදිංචියෙන් ඉවත් වන අතර, එ අනුව එකී සමාගමෙහි නාමය ඉහත සඳහන් දින සිට ඒස් පවර් ජෙනරේෂන් මාතර ලිමිටඩ් නමින් හඳුන්වන බව මෙයින් දන්වා සිටිමු.

ලියාපදිංචි කාර්යාලය : අංක 305, වොක්ෂෝල් වීදිය, කොළඹ 2.

එයිට්කින් ස්පෙන්ස් කෝපරේට්
ෆයිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-243

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවතේ, ලිලි ඇවනිව්හි අංක 41 දරන තැන පදිංචි දැනට ඕස්ට්‍රේලියාවේ, VIC 3031, ප්ලෙමින්ග්ටන් පාරේ, පෙලෙමින්ග්ටන්හි අංක 5/61 දරන තැන පදිංචිව සිටින සාරධා හේමමාලි, රත්නායක වි. පෙර ඒකනායක වන මම, මහනුවර, දංගොල්ලේ, අංක 20/1, දරන තැන පදිංචි මදමානගේ අනෝමා ප්‍රියන්ති ප්‍රනාන්දු යන අයට ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පත්මි උදේනිකා අබේසිරිවර්ධන සහතික කළ අංක 282 සහ 2008.08.08 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර එකී මදමානගේ අනෝමා ප්‍රියන්ති ප්‍රනාන්දු මා වෙනුවෙන් එළඹෙන කිසිදු ගනුදෙනුවක වගකීම මා බාර නොගන්නා බවද මම මහජනයා වෙත මෙයින් වැඩිදුරටත් දන්වා සිටිමි.

සාරධා හේමමාලි රත්නායක වි. පෙර ඒකනායක.

03-207

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොළඹ 15 කිඹුලාඇල, මාදම්පිටිය පාර අංක 162/328 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 738551230 X දරන කිඩ්නසාමි කලයරසි වන මා විසින් 1999 නොවැම්බර් මස 26 වැනි දින කොළඹ 15 කිඹුලාඇල, මාදම්පිටිය පාරේ අංක 162/328 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 782510185 X දරන කිඩ්නසාමි අරසකුමාර් වෙත බලය පවරාදුන් එස්. ගංගාරන් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 3711 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් එහි වූ කාර්යයන් ඉටුකිරීම සඳහා එකී ඇටෝර්නි බලකරුට පැවරූ බලය මෙයින් නිෂ්ප්‍රභා කරමි.

කිඩ්නසාමි කලයරසි.

2009 මාර්තු මස 27 වැනි දින.

04-293

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

S. C. GRAPHICS (PRIVATE) LIMITED

2009.02.20 දින, අංක පී. වී. 67103 යටතේ සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි ලිපිනය : අංක 402/10, බෝගහවිල පාර, කොට්ටාව.

04-300

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : ජීපී/02/01431/කේ2/494.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2008.12.05 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2009.02.02 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය අංක 3, පාගොඩ පාර, නුගේගොඩ හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2009.05.04 වැනි දින මධ්‍යහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වැකේ උප කාර්යාලයට අයත් රදාවාන පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. නන්දසේන විසින් සකසන ලද 2001.07.09 වැනි දින සහ අංක 2527 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 01, පර්. 12.90 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඩී 319/24 හි ලියාපදිංචි වී ඇත.

තවද, එකී අංක 2527 දරන පිඹුරේ සඳහන් අඩි 12ක් පළල මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 මාර්තු මස 26 වැනි දින,
අංක 269, ගාලුපාර, කොළඹ 3.

04-283/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : ජීපී/02/00698/සී2/383.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.12.23 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2006.05.08 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය අංක 3, පාගොඩ පාර, නුගේගොඩ හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2009.05.04 වැනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව මහ නගර සභා සීමාව තුළ කුරණ 4 වැනි කොට්ඨාසයේ රාජසිංහ පාර, වරිපනම් අංක 191/6 හි පිහිටි කොස්ගහවතුපංගුව සහ කොස්ගහවත්තේ බටහිර කොටසේ දෙකෙන් පංගුව නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් 2000.02.20 දින සකසන ලද අංක 1577 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 02 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 01 පර්. 15.3 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ 265/133 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 මාර්තු මස 26 වැනි දින,
අංක 269, ගාලුපාර, කොළඹ 3.

04-283/2

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 2/67382/බී2/131.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.01.05 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2009.01.12 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය අංක 3, පාගොඩ පාර, නුගේගොඩ හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා

විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2009.05.04 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය සභා සීමාවේ වැබඩ පිහිටි ගොඩපරගහවත්ත නොහොත් ගොරකගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එන්. සෙනෙවිරත්න විසින් 1992.01.26 වැනි දින සැකසුණු අංක 1255 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 16ක් වූ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක සී 340/111 හි ලියාපදිංචි වී ඇත.

තවද, එකී අංක 1255 දරන පිඹුරේ කැබලි අංක 4 මතින් දක්වා ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 මාර්තු මස 26 වැනි දින,
අංක 269, ගාලුපාර, කොළඹ 3.

04-283/3

---

**පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ක්වූ අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ. ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ ගම්පහ ඉහලගම ගමෙහි පිහිටි කොන්ගහවත්ත හෙවත් මීගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් මැන සාදන ලද අංක 1505 සහ 1999.12.27 වැනි දිනැති සැලැස්මේ ලොට් 'ඒ' කැබැල්ල වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද (අ. 0 රූ. 0 පර්. 12.26) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහ කොළ පළතුරු ආදී සියල්ල ද වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ ගම්පහ ඉහලගම ගමෙහි පිහිටි කොන්ගහවත්ත හෙවත් මීගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් මැන සාදන ලද අංක 1505 සහ 1999.12.27 වැනි දිනැති සැලැස්මේ ලොට් 'බී' කැබැල්ල වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද (අ. 0 රූ. 0 පර්. 26.13) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු ආදී සියල්ල ද වේ.

ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 12.26
අ. 0 රූ. 0 පර්. 26.13

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. කේ. එන්. පී. විතාරන විසින් සහතික කරන ලද අංක 8328 සහ 2006.12.12 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් අනුර ෆාමසි (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් ද ජයනි ජයරානි කුරුප්පුආරච්චි උකස්කරු වශයෙන් ද උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.03.25 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත් සහ 2009.04.03 වැනි දින ගැසට් පත්‍රය ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - ගම්පහ රෝහල හන්දියේ සිට කුවින්ස් මේරි පාර දිගේ මීටර් 100ක් පමණ ඉදිරියට ගොස් දකුණට හැරී ගල් සහ තාර යොදා ඇති විජයරාම පාර නැමැති නගර සභා පාර දිගේ මීටර් 100ක් පමණ ගිය විට එකී පාරේ වම් පස විකිණීමට නියමිත ඉඩම හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදල් 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජොෂ්ඨ කළමණාකරු නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 135, බැද්දගාන පාර,
පිටකෝට්ටේ.

දුරකථන අංක : 2873656, 077-672082
ෆැක්ස් අංකය : 2871184.

04-303/2

---

**පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ක්වූ අප්‍රේල් මස 27 වැනි දින ප. ව. 3.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, අංක 3206 දරන සහාධිපත්‍ය සැලැස්මේ ලොට් බී 1 වශයෙන් දැක්වෙන ඉඩමේ ඉදිකරන ලද මහල් 24 කින් යුක්ත සහාධිපත්‍ය නිවාස ගොඩනැගිල්ලේ 15 වැනි මහලෙහි පිහිටි කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 කොල්ලුපිටියේ පිහිටි කොල්ලුපිටිය පාර වරිපනම් අංක 75-14/2 දරන බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වල විසින් මැන සාදන ලද අංක 3206 සහ 1999 අගෝස්තු මස 10 දින දරන සහාධිපත්‍ය සැලැස්මේ BA/F15/U6 ඒකකය ප්‍රමාණයෙන් වර්ග අඩි 1245.00ක් වූ ඒකකය.

ප්‍රමාණය (වර්ග අඩි 1245.00)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1797 සහ 2005 ඔක්තෝබර් මස 19 වැනි දින සහ අංක 2137 ඒ සහ 2006 ජූලි 21 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් මහතලගේ ගයාන් රමේෂ් පීරිස් විසින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.03.27 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත් සහ 2009.04.03 වැනි දින *ගැසට්* පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- කොළඹ 3, කොල්ලුපිටිය ගාලු පාරේ අරලිය ගහ මන්දිරය අසල ඔබරෝයි හෝටලයට පිවිසෙන මාර්ගය සහ කෙසේ වුව ද මෙම සහාධිපත්‍යය දේපළෙහි බස්නාහිර මායිම ගාලු පාර වන බැවින් ගාලු පාර ඔස්සේ ද දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදල් 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර් එස් එම් ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ
දුරකථන අංක : 2863121.

04-303/1

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ක්වූ අප්‍රේල් මස 28 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ, රාවතාවත්ත පිහිටි ගාලු පාර වරිපනම් අංක 396 දරන කැටකැලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ක්ලෙමන්ට් එච්. ජී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1070 සහ 1979 නොවැම්බර් මස 16 දින දරන සැලැස්මේ ලොට් සී 3 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉඩම. මෙම ඉඩම බලයලත් මිනින්දෝරු ජෙරල්ඩ් ඒ ද සිල්වා විසින් මැන සාදන ලද 2003 නොවැම්බර් මස 17 දිනැති අංක 2267 දරන සැලැස්ම අනුව යලි මැන දක්වා ඇත.

ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 25.35

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ජී. කුරේ විසින් සහතික කරන ලද අංක 5598 සහ 2005 දෙසැම්බර් මස 06 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් සීමාසහිත සිනෙප්‍රෙ (පුද්ගලික) සමාගම විසින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.03.30 වැනි දින ඩේලි නිව්ස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත සහ 2009.04.03 වැනි දින *ගැසට්* පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය*.- කොළඹ සිට ගාලු පාර දිගේ ගමන් කොට ලක්දිව ෆර්නිචර්ස් පසු කොට මීටර් 50ක් පමණ ඉදිරියට ගොස් වමට හැරී පුද්ගලික පාරේ මීටර් 70ක් ගිය විට විකිණීමට නියමිත ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදල් 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති , පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය, අංක 450 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර් එස් එම් ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ
දුරකථන අංක : 2863121.

04-303/4

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ක් වූ අප්‍රේල් මස 27 වන දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලයේ කුඹුකේ පත්තුවේ පොලොන්නරුව පිහිටි බුලත්වැලහේන හෙවත් දුවේමූකලාන හෙවත් සිල්වර්වැලි නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද අංක 721 සහ 1991 අප්‍රේල් මස 15 වැනි දිනැති සැලැස්මේ ලොට් 23 කැබැල්ල ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 13.60) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව් බී. එස්. පොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක. 3606 සහ 2008 අප්‍රේල් 29 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් දූල්වලගේ උපුල් පුෂ්පවීර විසින් උකස් කරන ලද දේපළ

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.03.26 වන දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ 2009.04.03 වන දින ගැසට් පත්‍රය ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- කොළඹ සිට හොරණ පාරේ කෝරලඉම හන්දියට පැමිණ දකුණට හැරී පරණ කහතුඩුව පාර දිගේ මීටර් කිහිපයක් ගමන් කොට දකුණට හැරී ගුරුගේවත්ත පාර දිගේ මීටර් 400 ක් පමණ ගමන් කොට ප්‍රජාශාලා භූමිය අසලට පැමිණ දකුණට හැරී තවත් මීටර් 250 ක් පමණ ගමන්කොට වමට හැරී අඩි 20 ක් පළල පාර දිගේ මීටර් කිහිපයක් ගමන් කල විට මෙකී පාරේ වම් පස විකුණන ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්).
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂ වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාල ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජොෂ්ඨ කළමණාකරු නීති පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර කොළඹ 03

දුරකථන 2565573/2565565

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්,තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු,

අංක 135, බැද්දගාන පාර,
පිටකෝට්ටේ.

දුරකථනය : 2873656, 0777-672082 ෆැක්ස් : 2871184.

04-303/3

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - නුවරඑළිය ශාඛාව මගින්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**ඉතා වටිනා කෘෂිකාර්මික දේපලක්**

නුවරඑළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාසයේ බඹරකැලේ ගමේ පිහිටි ශාන්ත ඇන්ඩෘස් නමැති ඉඩමට සර්වෙයාර් ජෙනරාල් විසින් සාදන ලද අංක එම්. යූ. පී. එන්. යූ. 1409 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 25 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස සහ එහි පිහිටි සියළු දේ ප්‍රමාණය හෙක්ටයාර් 0.066 මෙම දේපල, කතලුව ලියනගේ මහින්දදාස යන අය බන්ධනදායී ලෙසට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.*- නුවරඑළිය පල්ලිය පාර හන්දියේ සිට ශාන්ත ඇන්ඩෘ ඩ්‍රයිව් පාරේ ශාන්ත ඇන්ඩෘ පටුමග හන්දිය දක්වා ගමන් ගෙන එම පටුමගට හැරී ඉදිරියට වෝටර් ෆිල්ඩ් බෑන්ක් හන්දිය දක්වා ගමන් ගෙන දකුණට හැරී මීටර් 25 ක් පමණ ගිය විට පාරේ වම් පසින් අදාල දේපල පිහිටා තිබේ.

2009 ක් වූ මැයි මස 07 වන දින පෙ.ව. 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. යෝජනා සම්මුතිය සඳහා 2009.02.06 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.02.18 වන දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 011-2661821. 011-2661815

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් 081-2211025

04-282

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

**කොළඹ 04, විසාකා පාර, 29/17A හි කේ. කේ. ආර්. බිල්ඩර්ස් ආයතනයේ ණය වගකීම් සඳහා උකස් කළ, කොළඹ 04, විසාකා පාර, අංක 29/17 A හි පිහිටි දේපල**

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005 සැප්තැම්බර් 09 දිනැති අංක 1409/24 දරන *ගැසට් පත්‍රයේ* හා 2005 අගෝස්තු 29 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2009 මැයි මස 06 වෙනි දින පෙ.ව. 11.00 කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය කොට්ඨාස අංක 39 හා විසාකා පාරෙන් ඔබ්බට පිහිටියාවූද, (බලයලත් නියෝජිත ජී. ඩබ්. පර්ඩිනන්ඩ්ස් විසින් සාදන ලද 1966 මාර්තු 02 දිනැති අංක 1043ඒ/1962 දරන පිඹුරේ නිරූපිත ලොට් 9 ඒ හි උප කොටසක් වූ) විසාකා පාර වරිපනම් අංක 29/17 ඒ දරන, බලයලත් මිනින්දෝරු එම්. බාලක්‍රිෂ්ණන් විසින් සාදන ලද 1990 ජනවාරි 25 දිනැති අංක 427 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක. 427 දරන පිඹුරේ ලොට් ඒ ද, නැගෙනහිරට : විසාකා පාර, වරිපනම් අංක 29/20-27 දරන පරිශ්‍රයද , විසාකා පාරද, දකුණට : විසාකා පාර, වරිපනම් අංක 29/20 -27 දරන පරිශ්‍ර හා විසාකා පාර ද, බස්නාහිරට : එකී අංක. 427 හි ලොට් සී (අඩි 10 ක් පළල පාර) මායිම් ව එකී අංක 427 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම බිංදුවයි තුනක (අ. 0, රූ. 0, පර්. 8.03) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 812/245 හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

එකී හැව්ලොක් ටවුම කොට්ඨාසයේ වර්තමානයේ මිලාගිරිය කොට්ඨාසයේ විසාකා පාර, අංක 29 දරන පරිශ්‍රයේ කොටසක් වූද බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. පර්ඩිනන්ඩ්ස් විසින් සාදන ලද 1966 මාර්තු 02 දිනැති අංක 1043ඒ/1962 දරන පිඹුරේ විස්තර කළ ලොට් 5 (වෙන් කළ පාරක්වූ) වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරටඃ විසාකා පාර වරිපනම් අංක 29 (කොටසක්) දරන පරිශ්‍රය සහ එකී පිඹුරේ ලොට් 4, 2, 7 සහ 8 ද, නැගෙනහිරට : වජිරා පටුමග, වරිපනම් අංක 04 දරන පරිශ්‍රය සහ එකී පිඹුරේ ලොට් 6, 7, 9 සහ 11 ද, දකුණට : එකී පිඹුරේ ලොට් 3, විසාකා පාරේ, වරිපනම් අංක 35, සහ 33 දරන පරිශ්‍රය සහ එකී පිඹුරේ ලොට් 11, 10 සහ 12 ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1, 3 සහ 4 සහ විසාකා පාර, වරිපනම් අංක. 29 (කොටසක්) සහ 27 දරන පරිශ්‍රයද, මායිම්ව එකී අංක 1043ඒ/1962 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් එකොලහයි දශම පහයි නවයක (අ. 0, රූ. 1, පර්. 11.59) ප්‍රමාණයෙන් යුක්තවේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 812/246 හි ලියාපදිංචි කර ඇත.

එකී හැව්ලොක් ටවුම කොට්ඨාසයේ වර්තමානයේ මිලාගිරිය කොට්ඨාසයේ විසාකා පාරේ පිහිටියාවූද, එකී අංක 1043/ඒ 1962 දරන පිඹුරේ නිරූපිත ලොට් 11 වශයෙන් සඳහන් (වෙන්කළ පාරක්වූ) බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එකී පිඹුරේ ලොට් 5 ද, නැගෙනහිරට සහ දකුණට : විසාකා පාරේ වරිපනම් අංක 33 දරන පරිශ්‍රය ද, බස්නාහිරටඃ අංක. 1043ඒ/1962 දරන පිඹුරේ ලොට් 5 ද, මායිම්ව එකී අංක 1043ඒ/1962 දරන පිඹුර අනුව පර්චස් දශම අටයි එකක (අ. 0, රූ. 0, පර්. 0.81) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 812/247 හි ලියාපදිංචි කර ඇත.

එකී හැව්ලොක් ටවුම කොට්ඨාසයේ වර්තමානයේ මිලාගිරිය කොට්ටාසයේ විසාකා පාරේ පිහිටියාවූ ද, එකී අංක 1043 ඒ/1962 දරන පිඹුරේ නිරූපිත ලොට් 9 සී වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එකී පිඹුරේ ලොට් 9 ඒ ද, නැගෙනහිරට :එකී පිඹුරේ ලොට් 9 බී ද, දකුණට : විසාකා පාරේ වරිපනම් අංක 35 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : එකී අංක 1043ඒ/1962 දරන පිඹුරේ ලොට් 5 (වෙන්කළ පාර) ද මායිම්ව එකී අංක 1043ඒ/1962 දරන පිඹුර අනුව පර්චස් තුනයි දශම දෙකයි පහක (අ. 0 රූ. 0 පර්. 3.25) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 812/237 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්න බණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු.

ලංකා බැංකුව,
අයකරගැනීම් - ආයතනික,
අංක 04, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

04-299

---

## සෙලාන් බෑන්ක් පී.එල්.සී. - හලාවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ආරච්චි කට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වයිරන්කට්ටුව ගමේ වයිරන්කට්ටුව ආරච්චිකට්ටුව මාර්ගයට මායිම්ව පිහිටි වයිරන්කට්ටුව කැලේ නමැති ඉඩමට බලයලත් මානක එස්. එම්. දිසානායක විසින් සාදන ලද 1998.12.09 වන දින අංක 6368 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 නැමති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සියළු දේ ප්‍රමාණය පර්චස් 80.46 මෙම දේපල, ආරච්චිකට්ටුව පදිංචි ජයකොඩි මොහොට්ටි අප්පුහාමිලාගේ හේමන්ත නිහාල් ජයකොඩි යන අය බන්ධනදායී ලෙසට සෙලාන් බෑන්ක් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම*.- හලාවත නගරයේ සිට පුත්තලම මාර්ගයේ කි. මී. 12 ක් පමණ කි. මී. 86 කණුව පසුකර වම් දෙසින් පිහිටි එම්. ඩී. යාපා මාවතට හැරෙන්න. එම මාවතේ කි. මී. 1.8ක් පමණ පාරේ වම් දෙසින් පිහිටි ක්‍රිස්තු පල්ලිය හා ට්‍රාන්ස්ෆෝමරය පසු කළ වහාම මෙම බොරළු පාරේ දකුණු පසින් අදාල දේපල පිහිටා තිබේ. 2009 ක් වූ මැයි මස 05 වන දින ප.ව. 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.02 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.12.29 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ 2009.01.19 වන දින වීරකේසරි පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැන්ක් පී. එල්. සී. සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල. අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701284, 011-2456285, 011-2456291, 011-2456284

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් : 081-2211025

04-280

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කුරුණෑගල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

#### ව්‍යාපාරයකට/පදිංචියට සුදුසු වටිනා දේපලක්

පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගාල්ලේහැපිටිය ගමේ පිහිටි කෝන්ගහමුලහේන නමැති ඉඩමට බලයලත් මානක ඒ. අතපත්තු විසින් සාදන ලද 2004.10.01 වන දිනැති අංක 146/2004 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් අංක 2 ඒ දරන ඉඩම් කොටස හා එහි පිහිටි නිවස ඇතුළු සියළු දේ. ප්‍රමාණය පර්චස් 30 මෙම දේපල, පතිරාජා මුදියන්සේලාගේ ජයලත් අසෝක කුමාර පතිරාජා යන අය ණයකරු හැටියට, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම*.- කුරුණෑගල සිට පුත්තලම පාරේ වාරියපොල දක්වා ගමන්ගෙන වමට හැරී හලාවත පාරට පිවිස මීටර් 4 ක් පමණ රඹාවැව දක්වා ගමන් ගෙන නැවත වමට හැරී කටුපොත පාරට ඇතුළු වී මීටර් 250 ක් පමණ ගිය විට මෙම පාරේ වම් දෙසින් අදාල දේපල පිහිටා තිබේ. 2009 මැයි මස 05 වන දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.06 වන දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2009.01.20 වන දින දිවයින, තිනකරන් හා 2009.01.21 වන දින අයිලන්ඩ් පුවත්පත බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 011-2661821, 011-2661815

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් අංකය : 081-2211025

04-279

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - නුවරඑළිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නුවරඑළිය නගර සභා සීමාවන් තුල කලුකැලේ 4 වන පටුමගට ඔබ්බෙන් පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එන්. අල්විස් 1994.08.30 වන දින සාදන ලද අංක 1692 දරන පිඹුරේ බෙදා වෙන් කළ ලොට් 11 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර 0.0620 මෙම දේපල, ගවරම්මන මාපා මුදියාන්සේලාගේ පියසිරි ණයකරු හැටියට, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම*.-නුවරඑළිය නගර මධ්‍යයේ සිට බදුල්ල මාර්ගයේ කි. මී. 1.75 ක් පමණ ගමන් ගෙන දකුණට හැරී කලුකැලේ පාරේ මීටර් 150 ක් පමණ ගමන් කර වමට ඇති 4 වන පටුමගට පිවිස මීටර් 150 ක් පමණ ගිය පසු මෙම මාර්ගයේ වම් පසින් අදාල දේපල පිහිටා තිබේ.

2009 ක් වූ මැයි මස 07 වන දින පෙ.ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.23 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.01.27 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

